වට්ස්සැප් මුහුණු පොත සහ අනෙකුත් සමාජ මාධ්‍ය සඳහා ආචාර ධර්ම මාලාව

1. සේවය කිරිම පෙරදැරිව ක්‍රියාත්මක සංවිධානයක සාමාජිකයෙක් වශයෙන් ඔබට සංවිධානයේ ගෞරවය ආරක්ෂා කිරිම වෙනුවෙන් පෞද්ගලික මෙන්ම පොදු වගකීමක් ඇත.
2. ඔබගේ සමාජ මාධ්‍ය භාවිතය ඔබගේ මෙන්ම සංවිධානයේ විනය හා හැදියාව පිළිඹුඹු කරයි.
3. සිංහ සාමාජිකයකුට සිංහ සමාජයේ ගෞරවයට හා අරමුණුවලට කැළලක් වන ආකාරයේ අදහස් ප්‍රවර්ධනයට අයිතියක් නොමැත
4. ඔබ විසින් පවත්වන සාද වලදි සහ අනෙකුත් සේවා කටයුතු වලදි මත්පැන් පානය කිරිම හෝ එය ප්‍රවර්ධනය කරන ඡායාරූප උඩුගත කිරිමෙන් වැලකිය යුතුය.
5. ඔබ විසින් ඔබේ සමාජ මාධ්‍ය අඩවිය තුල පලකරනු ලබන ඔබේ අදහස් හෝ ඔබ බෙදා හරින වෙනත් අයගේ අදහස් සංවිධානයේ පොදු මතය හා අනුකූල සහ සංගත විය යුතුය.
6. තමන්ගේ පුද්ගලික ගැටුම් අභිලාෂයන් ප්‍රකාශයට පත් කිරිමට සමාජ මාධ්‍ය යොදා නොගත යුතුය.
7. දේශපාලන පක්ෂ , ආගම සහ වාර්ගිකත්වය යන දේ පුද්ගලයාගේ විශ්වාසය මත පවතී. ඔබට මෙන්ම අන් අයටද ඔවුන්ගේ විශ්වාසයන් දැරිමට හිමිකම ඇති හෙයින් එවැනි සංවේදිකරුණු ගැන සිංහ සමාජයට අදාල සමාජ මාධ්‍ය ජාලාවන්හිදි විවේචනාත්මක මත පලකිරිමෙන් වලකින්න.
8. ඔබගේ සිංහ සමාජයේ අභ්‍යන්තර මතවාද ,ගැටුම් හා නොගැලපීම් සමාජ මාධ්‍ය තුල සාකච්ඡා නොකල යුතුය. අධ්‍යක්ෂක මණ්ඩලය තුලදි කරනු ලබන විවෘත සහ සුහද සාකච්චාවක් මගින් බොහෝ අනවබෝධයන් දුරලිය හැකිය.
9. සිංහ ජාත්‍යන්තරයේ සාමාජිකයකු වශයෙන්, සිංහ දර්ශනය, සිංහ දිස්ත්‍රික්කයේ පරිපාලනය සම්බන්ධයෙන් ඔබේ අදහස් විවේචන සමාජ මාධ්‍ය තුල ප්‍රකාශ නොකළ යුතුය. විවේචනය සහ අදහස් දැක්වීම සඳහා **සුදුසු අභ්‍යන්තර මණ්ඩපයකදි** පමණක් එවැනි විවේචන කල යුතුය.
10. සිංහ ජාත්‍යන්තරය , සිංහ දිස්ත්‍රික්කය හෝ සිංහ සමාජයට අදාල නිලවරණයක් සම්බන්ධයෙන් අදහස් දැක්වීම නොකල යුතු අතර ඔබ යම් අපේක්ෂකයකුට හෝ මතවාදයට සහය දක්වන්නේ නම් **එය සිංහ සමාජ සමාජිකයන්ට පමණක්** අදාල වන සමාජ මාධ්‍යක පමණක් එම සහයදීම කල යුතුය. බාහිරට නිරාවරණය වූ කිසිදු සමාජ මාධ්‍යක එවැනි කටයුතු නොකල යුතුය.
11. ඔබට ඔබ සහය දෙන අපේක්ෂකයා සම්බන්ධයෙන් අගය කළ හැකි අතර ප්‍රතිවාදි අපේක්ෂකයකු සම්බන්ධයෙන් හෝ ඔහුට හෝ ඇයට සහය දක්වන පෝස්ටුවක් සම්බන්ධයෙන් කිසිදු ආකාරයක ප්‍රතිචාරයක් නොදැක්විය යුතුය.
12. කිසිදු සමාජිකයකුට සිත් වේදනාවන් හෝ අපහාසයක් ඇතිවන ආකාරයේ පෝස්ටුව කිසිදු මාධ්‍යක පල නොකළයුතුය.

13. ඔබ විසින් නොදන්නා හෝ ඔබට තහවුරු කර ගත නොහැකි නැතිනම් තර්කානුකූල නොවන දේ සමාජ මාධ්‍ය තුල පල නොකළ යුතුය.
14. ඔබ පලකරන අදහස් වෙනුවෙන් ඔබ වගකිව යුතුය.
15. පුද්ගලයකුගේ පෞද්ගලික ජීවිතය පිළිබඳව විවේචන නොකළ යුතුය.
16. ඉහත කරුණු වලට අදාලව වෙනත් අයකු විසින් පලකරනු ලබන දෙයක් නැවත පල කිරිමද එය ඔබ විසින් එහි අන්තර්ගතය අනුමත කිරිමක් ලෙස සැලකිය යුතුය.